මගේ අංකය : PUB.ADM/SEC/13
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2017 ඔක්තෝම්බර් මස 04 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය

01. ශ්‍රී ලංකාව කෘෂිකර්මයෙන් ස්වයංපෝෂිතව පැවති රටක් බව නොරහසකි. නමුත් නියං, සාගත හා ගංවතුර වැනි ස්වභාවික ආපදාවන් සහ අභ්‍යන්තර ගැටුම් හා විදේශීය ආක්‍රමණ පැවැති යම් යම් කාල වකවානුවලදී මෙරට කෘෂිකර්මාන්තය පසුබෑම් වලට ලක්වී ඇත. පසුගිය කන්න කිහිපය තුලම (2016-2017) විටින් විට පැවැති නියං හා ගංවතුර ආපදා නිසා එම තත්ත්වයට අද අප රටක් වශයෙන් ප්‍රායෝගිකව මුහුණ දෙමින් සිටින්නෙමු. මෙහි ප්‍රධාන බලපෑමක් වශයෙන් රජයට විශාල විදේශ විනිමයක් වැයකොට විදේශීය රටවලින් සහල් හා වෙනත් අත්‍යාවශ්‍ය ආහාර වර්ග ගෙන්වීමට සිදු වී ඇත.

02. මෙවැනි පසුබිමක් තුල වස විසෙන් තොර දේශීය ආහාර නිෂ්පාදනයේ කඩිනම් සංවර්ධනයක් ඇති කිරීමේ අභිප්‍රායෙන් **'යලි අපි නැගිටිමු අටු කොටු පුරවමු'** තේමාව පදනම් කරගෙන අතිගරු ජනාධිපතිතුමා විසින් සියළුම පාර්ශව වල සහභාගීත්වය හා අවධානය ලබාගත හැකිවන පරිදි ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයක ආරම්භයක් ලෙස 2017 ඔක්තෝම්බර් 06 සිට ඔක්තෝම්බර් 12 දක්වා සතිය ප්‍රකාශයට පත්කොට ඇත.

03. මෙම සද්කාර්යයේ දී කෘෂිකර්ම ක්ෂේත්‍රය සහ ඊට අනුබද්ධ සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, ගොවි ප්‍රජාව මෙන්ම පෞද්ගලික අංශයේද දායකත්වයෙන් කඩිනම් වැඩපිළිවෙලක් හඳුන්වා දී ඇති අතර රාජ්‍ය සේවකයින් වන අප සැමගේද සක්‍රීය දායකත්වය මේ සඳහා ලබා දීම අපගේ වගකීමක් හා යුතුකමකි.

04. රාජ්‍ය නිලධාරීන් වශයෙන් විවිධ ක්‍රියාකාරකම් මගින් මෙම වැඩසටහන සඳහා අපගේ සහය ලබාදිය හැකි බව පෙන්වා දෙමි.

**<u>රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යය භාරය</u>**

I. රාජ්‍ය සේවකයින් පදිංචිව සිටින තම පෞද්ගලික නිවාස ආශ්‍රිත ගෙවත්ත/රජයේ නිල නිවාස පිහිටි ගෙවත්ත තුල එළවළු, පලතුරු වැනි ගෙවතු බෝග මෙන්ම දීර්ඝ කාලීන එල දරන වගාවන් ඇති කිරීම.

II. උසස් ප්‍රමිතියෙන් යුතු, වැඩි ඵලදාවක් ලබාදෙන පැල වර්ග හා බීජ වර්ග සුදුසු පැල තවාන් වලින් ලබාගෙන තම අමාත්‍යාංශයේ, සේවා ස්ථානයේ නිලධාරීන්ට බෙදා දීමට පියවර ගැනීම.

III. තමා සේවය කරන කාර්යාල භූමියේ එළවළු, පලතුරු වර්ග හා දීර්ඝ කාලීන එල දරන ශාක වගා කිරීමට පියවර ගැනීම.

IV. තම අසල් වාසීන් සහ පොදු ජනතාව ද මෙම කාර්යය සඳහා දැනුවත් කොට උනන්දු කරවීම.

V. පොදු ජනතාවට මේ සඳහා අවශ්‍ය බීජ, පැල වර්ග, වෙනත් සහාය සේවාවන් හා තාක්ෂණික දැනුම ලබා දීමට අවශ්‍ය සහයෝගය ලබාදීම.

VI. පාසල් භූමි තුල ළමයින්ගේ දායකත්වයෙන් ගෙවතු වගා ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

VII. ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දායකත්වය උපරිම ලෙස ලබා ගැනීම.

ගෙවතු වගා අධීක්ෂණය කිරීමටත්, අවශ්‍ය සම්පත් දායකත්වය ලබා දීම සම්බන්ධීකරණය කිරීමටත් (පැල වර්ග, බීජ වර්ග, තාක්ෂණික උපදෙස්), දත්ත රැස් කිරීමටත්, ප්‍රගති වාර්තා ලබා ගැනීමටත්, ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී, කෘෂි පර්යේෂණ සංවර්ධන සහකාර නිලධාරී වැනි ක්ෂේත්‍ර නිලධාරීන් යොදවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ බල ප්‍රදේශ තුල ග්‍රාමීය ගෙවතු වගා දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

VIII. යහපත් ආහාර පරිභෝජන රටාවන් පිළිබඳව දැනුවත් කිරීම.

සුදුසු සම්පත් දායකයකු යොදවා රාජ්‍ය ආයතන මට්ටමින් හා පාසල් මට්ටමින් දේශීය ආහාර භාවිතයට ගැනීම, ආහාර නාස්තිය අවම කිරීම, වස විසෙන් තොර ආහාර පරිභෝජනය, පෝෂ්‍යදායී ආහාර වේලක් සකස් කර ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීම.

IX. තරඟ පැවැත්වීම.

මෙම වැඩසටහනට සියල්ලන්ගේ සහභාගීත්වය හා දායකත්වය වැඩි කරවීම සඳහා තරඟ වැඩ සටහන්, රාජ්‍ය සේවක ගෙවතු වගා මට්ටමින්, රාජ්‍ය ආයතන මට්ටමින් හා පාසල් මට්ටමින් පැවැත්වීමට කටයුතු කිරීම.

X. වැඩසටහන භාරව ක්‍රියාකිරීම හා අධීක්ෂණය කිරීම.

මේ සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මට්ටමින් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කිරීමට පියවර ගැනීම.

05. මෙම මහඟු වැඩසටහන සාර්ථක කර රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මෙන්ම කෘෂිකාර්මික අතින් ස්වයංපෝෂිත රටක් නිර්මාණය කර ගැනීම සඳහා රාජ්‍ය සේවක ඔබ සැමගේ කැපවීම හා දායකත්වය ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් :- 1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කාරු.දැ.ගැ.පි.

2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාතය කාර්යාලය - කාරු.දැ.ගැ.පි.